# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 පෙබරවාරි මස 21 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.31 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුසාර දිනාල්
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
ඉන්දික බණ්ඩාර
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එස්. කුහවරදන්
කාමල් කුරුප්පු
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
චන්දන ජයකොඩි
නිමල් ආර්. පීරිස්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
රොයිස් විජිත
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශ්‍රීනාත් පෙරේරා

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදන :

*i*

*"2017.02.09 දින ලංකාදීප පුවත්පතේ 2 වන කොටසෙහි පළමු පිටුවේ ආණ්ඩුකාරයා වැරදි වැඩකට අතදාලා යන ශීර්ෂය යටතේ පළ වී ඇති වාර්තාවට අදාළව පැහැදිලි කිරීමක් බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් විසින් දිනපතා ලංකාදීප ප්‍රධාන කර්තෘ වෙත යොමු කර තිබෙන බවත්, එම පැහැදිලි කිරීමේ පිටපතක්, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමාව දැනුවත් කිරීම සඳහා හා අවශ්‍ය කටයුතු සඳහාත් ඒ සමගම එවන බවත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ GOS/ADM/14/2/8/4 හා 2017.02.09 දිනැති ලිපිය මගින් සභා ලේකම්තුමා වෙත දන්වා එවා තිබෙන බවත්,*

*ඒ පිළිබඳව තමාගේ අවධානය ද යොමු කරනු ලැබූ බවත්, ගරු මන්ත්‍රීවරුන්ගෙන් තමා ඉල්ලා සිටින බවත්, ස්වකීය අභිමතය පරිදි කටයුතු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ඉඩ ලැබෙන තාක් දුරට, ගරු ආණ්ඩුකාරතුමා තම කාර්යයන් සපුරාලීම කෙරෙහි බලපාන කිසියම් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදු නොවිය යුතුය යන්න කෙරෙහි (රීති අංක 64(3)) දැඩි අවධානයකින් සභාවේ කටයුතුවලට සහභාගිවන ලෙසටත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.*

*ii*

*"ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2017.01.03 වන දින ශ්‍රී ලංකා ජනරජයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති, බලගතු ශ්‍රී ලංකාවක් - ජාතික ආර්ථික සංවර්ධන සැලැස්ම නම් වූ පොතෙහි සිංහල හා දෙමළ පිටපත් සීමිත සංඛ්‍යාවක් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් වෙත බෙදා දීම සඳහා අග්‍රමාත්‍ය ලේකම් විසින් සියලුම පළාත් සභාවල සභා ලේකම්වරුන් අමතමින් අංක PMO/1/Gen හා 2017.01.09 දිනැති ලිපිය සමඟ එවා තිබෙන බවත්,*

*ඒ පිළිබඳව 2017.02.08 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී අවධානය යොමු කරන ලද අතර එම කාරක සභා නිර්දේශය අනුව එම පොතෙහි පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

***අයවැය නිල [හැන්සාඩ්] වාර්තා :***

*"2017 වර්ෂය වෙනුවෙන් පැවැති 2016 දෙසැම්බර් මස 06, 07, 08, 09, 14 හා 15 යන දිනයන්හි නිල [හැන්සාඩ්] වාර්තා අද දින සභාගත කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2017.02.08 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. නොපැමිණ සිටීමේ අවසරය :

*"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***පූ.භා. 10.35 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***පූ.භා. 11.30 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

## 04. ශෝක ප්‍රකාශ යෝජනාව I : දයාරත්න රණේපුර මැතිතුමා

සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් පහත සඳහන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් සමාජවාදී පෙරමුණ නියෝජනය කරමින් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෙරී පත් වී වසර පහක් පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවන් ඉටු කරන ලද ගරු දයාරත්න රණේපුර මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***ශෝක ප්‍රකාශ යෝජනාව ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් වෙත ලැබෙන්නට සලස්වන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට දැනුම් දෙන ලදී.***

## 05. ශෝක ප්‍රකාශ යෝජනාව II : සරත් සුමනසේකර මැතිතුමා

සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් පහත සඳහන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ පස්වන පළාත් සභාවට හා හයවන පළාත් සභාවට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෙරී පත් වී වසර පහකට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරමින් සිටි ගරු සරත් සුමනසේකර මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***අ.භා. 12.40 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 06. රීති අංක 30 යටතේ යෝජනාව :

සුමිත්ලාල් මැන්දිස් - ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කළ යුතුය."*

***ශෝක ප්‍රකාශ යෝජනාව ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් වෙත ලැබෙන්නට සලස්වන මෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ලේකම්වරයාට දැනුම් දෙන ලදී.***

## 07. කල් තැබීම :

අනතුරුව, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා ] විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.54 ට, 2017 මාර්තු මස 07 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,<br>
ලේකම්,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.02.22<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව,<br>
5 වන මහල,<br>
බී පර්යන්තය,<br>
සෙත්සිරිපාය,<br>
බත්තරමුල්ල.<br>
කුමා/22